(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 75.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2016 ජූනි මස 08 වැනි බදාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

77/'15

1.

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2014.07.01 දින සිට ආනයනය තහනම් කරනු ලැබූ ආහාර සඳහා යොදන රසකාරක වර්ග කවරේද;

(ii) එම එක් එක් රසකාරක වර්ගය, තහනම් කිරීමට හේතුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත තහනම් කළ රසකාරක මෙන්ම, අජිනමොටෝ නොහොත් මොනෝසෝඩියම් ග්ලූටමේට් (MSG) රසකාරකය ද මිනිස් සිරුරට අහිතකර බවත්;

(ii) එය පිළිකා, ස්නායු ආබාධ ඇතුළු දරුණු රෝගාබාධ සඳහා හේතු කාරක වන බවත්;

(iii) වසරකට එම රසකාරක මෙට්‍රික් ටොන් 2200කට වැඩි ප්‍රමාණයක් මෙරටට ආනයනය කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) මොනෝසෝඩියම් ග්ලූටමේට් භාවිතය තහනම් කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

409/'16

2.

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ත්‍රිකුණාමලය ප්‍රදේශයේ ධීවර සමිතියක් වෙනුවෙන් ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව විසින් රුපියල් ලක්ෂ 750ක මුදලක් දේශපාලනඥවරියකට ලබාදී තිබේද;

(ii) ඇයගේ නම කවරේද;

(iii) එසේ නම්, එම ණය මුදල ලබාදීම සඳහා ඇපයට තබාගෙන ඇති දෑ කවරේද;

(iv) එම ණය මුදලෙන් මේ වනවිට කොපමණ ආපසු අය කරගෙන තිබේද;

(v) එසේ නොමැති නම්, දිගින් දිගටම ගෙවීම් පැහැර හැරීම සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

(vi) ඒ පිළිබඳව සම්පූර්ණ විස්තරයක් සභාගත කරන්නේද;

(vii) ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවෙන් ලබාදෙන ණය සඳහා පන්සල්වල ඔප්පු, කල්බදු ක්‍රමයට රජයෙන් ලබාගත් ඉඩම් හෝ තිරුවානා ගල් ඇපයට තබාගත හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

435/'16

3.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 ජනවාරි 16 දින හෝ ඒ ආසන්න දිනයකදී බේස්ලයින් පාරේ, දෙමටගොඩ, ඥාණසිංහාරාමය විහාරය ඉදිරිපස ඇති පාර මාරුවීමේ කහ ඉරි තීරුව මත මවක් සහ දියණියක් වාහනයක ගැටී මියගිය බවත්;

(ii) එම කහ ඉරි තීරුව මත මීට පෙරද අනතුරු ගණනාවක් සිදු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම කහ ඉරි තීරුව දෙපස මාර්ගය බෑවුම් සහිත වීමද මෙසේ අනතුරු බහුලවීමට හේතු වී ඇති බව පිළිගන්නේද;

(ii) මෙතරම් අනතුරු සිදු වී තිබියදී එම කහ ඉරි තීරුව විකල්ප ස්ථානයකට ගෙන යාමට හෝ එම තීරුව දෙපස මාර්ග සංඥා සවිකිරීම සිදු නොකලේ මන්ද;

(iii) එම කහ ඉරි තීරුව විකල්ප ස්ථානයකට ගෙන යාම හෝ එම තීරුව දෙපස මාර්ග සංඥා සවි කිරීම සිදු කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

471/'16

4.

ගරු වාසුදේව නානායක්කාර මහතා,— විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට අයත් සියලු දුරකථනවලින් අයකරනු ලබන බදු වර්ග හා බදු ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එකී බදු සියල්ල එකතු වූ පසු මුළු අයකිරීමේ ප්‍රතිශතයක් ලෙස ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට කොපමණ අය කිරීමක් කළ හැකිද;

(iii) එම අයකිරීම් කරනු ලබන්නේ කුමන නිශ්චිත වගන්තියක් යටතේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

483/’16

5.

ගරු කනක හේරත් මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය ඇරඹූ අධිවේගී මාර්ගවලින් 2015.12.31 දක්වා ලැබූ ආදායම කොපමණද;

(ii) එම ආදායම, අපේක්ෂිත ඉලක්කය ඉක්මවා තිබේද;

(iii) එසේ නම්, රටෙහි ආර්ථිකයට මෙම අධිවේගී මාර්ග මඟින් ප්‍රතිලාභ අත්වන බව පිළිගන්නේද;

(iv) යෝජිත කොළඹ - නුවර අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු සිදු කරන්නේද;

(v) එසේ නම්, ඒ කවර දිනයක සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2015 වර්ෂය අවසාන දීර්ඝ නිවාඩු සමයේදී අධිවේගී මාර්ගවල දැඩි වාහන තදබදයක් තිබූ බව පිළිගන්නේද;

(ii) එවැනි තදබදයක් ඉදිරියේදී ඇති වීම වළක්වා ගැනීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

500/’16

6.

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඈත අතීතයේ සිට ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ, කින්නියා ගම්මානයේ මුස්ලිම් ජනතාව ජීවත් වූ බවත්;

(ii) එම ප්‍රදේශයේ පැවති ත්‍රස්තවාදී ගැටුම් හේතුවෙන් අවතැන් වූ මුස්ලිම් ජනතාව මෙතෙක් එම ගම්මානයේ නැවත පදිංචි කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ත්‍රස්තවාදී ගැටුම් හේතුවෙන් කින්නියා ගම්මානයේ අවතැන් වූ මුස්ලිම් පවුල් සංඛ්‍යාව සහ එම පවුල්වල සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම ජනතාව එහි නැවත පදිංචි කිරීමට හැකි ඉක්මනින් කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

553/’16

7.

ගරු සෙය්යිද් අලී සාහීර් මවුලානා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මඩකලපුව දිස්ත්‍රික්කයේ, කළුදාවල ගම්මානයේ ජීවත්වන පවුල් 1500 කට ආසන්න පිරිසක් ඔවුන්ගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය ලෙස බුලත් වගා කිරීමේ කටයුතුවල නියැලෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) බුලත් වගාව සාර්ථක ලෙස සිදු කිරීම සඳහා අත්‍යාවශ්‍ය වන, ‘‘බුලත් කොවුල්’’ පොතුවිල්, රොට්ටකුලම් ප්‍රදේශයේ සිට කපා ප්‍රවාහනය කිරීමට තහනමක් පනවා තිබේද;

(ii) එසේ නම්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අංක: බුලත් කොවුල් 2011 හා 2014.05.13 දිනැති චක්‍රලේඛය අනුව, ඔවුන්ට ඒ සඳහා අවසර ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— පාර්ලිමේන්තුවේ අංක 7 දරන ස්ථාවර නියෝගයෙහි සහ පාර්ලිමේන්තුව විසින් 2016.03.08 වැනි දින සම්මත කරන ලද යෝජනාවේ විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, අද දින පාර්ලිමේන්තුවේ රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 6.30 දක්වා විය යුතු ය.

2.

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ශ්‍රී ලංකා ළමා සංවර්ධන සංගමය (SLACD) සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 175/'16

1.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
ගරු ඩලස් අලහප්පෙරුම මහතා
ගරු වාසුදේව නානායක්කාර මහතා
ගරු විමල් රාජපක්ෂ මහතා
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
ගරු ගාමිණී ලොකුගේ මහතා
ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
ගරු විජිත බේරුගොඩ මහතා
ගරු විමලවීර දිසානායක මහතා
ගරු ජානක වක්කුඹුර මහතා
ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු ශෙහාන් සේමසිංහ මහතා

ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා

ගරු කනක හේරත් මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු කංචන විජේසේකර මහතා

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය

ගරු සී. බී. රත්නායක මහතා

ගරු එස්. ප්‍රේමරත්න මහතා

ගරු ජයන්ත සමරවීර මහතා

ගරු ලොහාන් රත්වත්තේ මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍ය ගරු රවී කරුණානායක මහතාට එරෙහි විශ්වාස භංගත්වය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 148 වැනි ව්‍යවස්ථාවට අනුව, රජයේ මුදල් කටයුතු පිළිබඳව පූර්ණ බලය පාර්ලිමේන්තුව සතුවන බැවින් ද, රාජ්‍ය මූල්‍ය කළමනාකරණයෙහි ලා ප්‍රධානතම උපකරණය වන වාර්ෂික අයවැය ලේඛනය මෙම උත්තරීතර සභාවට ඉදිරිපත් වනවිට, ඉතා විස්තරාත්මකව, විනිවිද භාවයකින්, උපරිම විශ්වාසය රැකෙන පරිදි, සත්‍ය ලෙස ඉදිරිපත් කිරීම මුදල් අමාත්‍යවරයාගේ ප්‍රධානතම යුතුකම හා වගකීම වන්නේ නමුදු, 2016 අයවැය ලේඛනය සම්මත කිරීමේදී මුදල් අමාත්‍යවරයා, දූර්නිරූපණයක් තුළින් පාර්ලිමේන්තුව හා මහජනතාව නොමඟ යවා එකී අයවැය ලේඛනය හුදු ප්‍රලාපයක් බවට පත්කළ බැවින් ද;

රටෙහි සමස්ත නිමවුම, ආදායම්, සේවා නියුක්තිය, මිල මට්ටම්, ගෙවුම් ශේෂය, ඉතුරුම් හා ආයෝජන වැනි සාර්ව ආර්ථික විචල්‍යයන් කෙරෙහි බරපතල හානිකර බලපෑම් ඇතිකොට, සමස්ත ආර්ථිකයම මුළුමනින්ම විනාශය කරා ගෙන යමින්, හිතුවක්කාරී, අනම්‍ය හා අත්තනෝමතික රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ප්‍රතිපත්තියක් අනුගමනය කරන නිසාවෙන්ද;

ශ්‍රී ලංකා රුපියල දිගින් දිගටම අවප්‍රමාණය වෙමින් ආනයන උද්ධමනකාරී පීඩනයක් වර්ධනය වන අතර, රට සතු නිල විදේශ සංචිත ඉතා දරුණු ලෙස පහත වැටීමෙන්, ආර්ථිකය පමණට වඩා රත්වී, අවදානම් සහගත තත්ත්වයක් නිර්මාණය වී ඇති බැවින්ද;

ස්වෛරී ණය ශ්‍රේණිගත කිරීමේදී (ෆිච් රේටිං) ශ්‍රී ලංකාව B+ නියෝධාත්මක (සෘණ) තත්ත්වයකට ශ්‍රේණිගත වීමෙන්, ශ්‍රී ලංකාවට ණය ගෙවීමට ඇති හැකියාව පිළිබඳව අවදානම් තත්ත්වයකට රට ඇද දමා ඇති හෙයින්ද;

2016ක් වූ ජනවාරි 30 දින, දිනමිණ ජාතික පුවත්පතෙහි මුල් පිටුවෙහි මුල් පුවතින්, "ආණ්ඩුවේ මූල්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ පැහැදීමක් - විදේශීය ආයෝජකයින් මෙරට බැංකුවල ඩොලර් බිලියන 1.2ක් තැන්පත් කරලා" යනුවෙන් මුදල් අමාත්‍යවරයාගේ ප්‍රකාශයක් ලොවපුරා ප්‍රචාරය කොට ඇති නමුදු දැවැන්ත විනිමය ප්‍රවාහයක් බැංකු තුළට ගලා නොආ බව මූල්‍ය හා බැංකු වෙළඳපොළ සඳහන් කරන බැවින් ද;

"මහින්දගේ ආණ්ඩුව ගත් තව කෝටි ලක්ෂයකට වැඩි ගණනක් ගිණුම්ගත වී නැති" බව මුදල් අමාත්‍යවරයා විශේෂ ප්‍රවෘත්ති සාකච්ඡාවක් පවත්වා කරන ලද බරපතල ප්‍රකාශය මඟින් රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ විධිවිධාන, දැනුවත්ව හෝ නොදැනුවත්ව කඩ කොට ඇති බැවින් ද;

මුදල් අමාත්‍ය ගරු රවී කරුණානායක මහතා පිළිබඳ මෙම ගරු සභාවේ විශ්වාසනීයභාවය සම්පූර්ණයෙන්ම නොමැති බැවින්, තවදුරටත් මුදල් අමාත්‍යවරයා විසින් එම ධුරයේ කටයුතු කිරීමේ හැකියාව පිළිබඳව විශ්වාසය භංග වී ඇති බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

*2.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන පාලන පනත යටතේ නියෝග (අංක 1),— 1985 අංක 48 හා 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 20 වැනි වගන්තිය යටතේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 පෙබරවාරි 11 දිනැති අංක 1953/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.10 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන පාලන පනත යටතේ නියෝග (අංක 2),— 1985 අංක 48 හා 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 20 වැනි වගන්තිය යටතේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 පෙබරවාරි 11 දිනැති අංක 1953/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.10 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,— ප්‍රමිති හා සේවා පනත යටතේ නියෝග,— 1995 අංක 35 දරන මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනතේ 60 වැනි වගන්තිය යටතේ ආහාර සුරක්ෂිතතාව අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 ජූලි 2 දිනැති අංක 1921/54 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.04.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධ ශාසන අමාත්‍යතුමා,— සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත යටතේ කරන නියමය,— 2002 අංක 25 දරන සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 අගෝස්තු 6 දිනැති අංක 1926/46 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.11.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධ ශාසන අමාත්‍යතුමා,— අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග,— 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 61 වැනි වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 පෙබරවාරි 18 දිනැති අංක 1954/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.08 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*10.

ක්‍රීඩා අමාත්‍යතුමා,— ක්‍රීඩා පනත යටතේ නියෝග,— ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 41 වැනි වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජනවාරි 15 දිනැති අංක 1793/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 2013 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝගවල ඇතුළත් 13 සහ 17 වැනි වගන්ති සංශෝධනය කරමින් 2015 නොවැම්බර් 9 දිනැති අංක 1940/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.01.26 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 213ඇ වගන්තිය සමඟ කියවියයුතු, එකී පනතේ 237 වගන්තිය යටතේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 දෙසැම්බර් 22 දිනැති අංක 1946/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*12.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*13.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*14.

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත යටතේ රීති,— 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත ප්‍රකාරව ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව විසින් සාදන ලදුව, 2015 ජූලි 21 දිනැති අංක 1924/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.23 දින ඉදිරිපත් කරන ලද 2015 අංක 1 දරන පරමාණුක බලශක්ති (බලපත්‍ර) රීති සහ 2015 අංක 1 දරන පරමාණුක බලශක්ති (ක්‍රියා පිළිවෙතක් පැවැත්වීමේ අදහස පිළිබඳ දැනුම් දීමේ) රීති අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*16.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*